# ව්‍යාපාර ආයෝජන අවස්ථා - අන්නාසි වගාව ආශ්‍රිත නිෂ්පාදන

ආරියදාස ජයවර්ධන
අධ්‍යක්ෂ - කාර්මික තොරතුරු

ශ්‍රී ලංකාවේ පවතින විවෘත වෙළඳපොළ ආර්ථික පසුබිමක ව්‍යාපාර අංශය ඉතා වැදගත් වේ. මෙය බොහෝ දෙනා පෞද්ගලික අංශය වශයෙන්ද හැඳින්වීමට පෙළඹී සිටිති. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයකර වෙළඳපොළට සපයන කර්මාන්ත ව්‍යාපාර වෙළඳ ව්‍යාපාර මෙන්ම බැංකු, සංචාරක හෝටල්, රෝහල් වැනි සේවා සපයන ව්‍යාපාරවලින් සමන්විත මෙම අංශය පිළිබඳ උනන්දුවක් දක්වන බොහෝ දෙනා ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර ආයෝජන අවස්ථා සොයමින් පසුවෙති.

ව්‍යාපාර ආරම්භ කිරීමට වාගේම ඒවා සාර්ථකව පවත්වාගෙන යාමට රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන බොහෝමයක් උපදේශක සේවා පහසුකම් ලබාදෙයි. එසේ වුවද දේශීය වෙළඳපොළ සඳහා හෝ විදේශීය වෙළඳපොළ සඳහා හෝ සුදුසු ව්‍යාපාර අවස්ථා හඳුන්වාදීමට ඉදිරිපත් වීම ඉතාමත් විරල බවක් දක්නට ඇත. විශේෂයෙන්ම නිෂ්පාදන කර්මාන්ත අංශයේ ව්‍යාපාර පිළිබඳ උනන්දුවක් දක්වන ප්‍රයෝජනවත් ව්‍යාපෘති රැසක් ආයෝජන අවස්ථා ලෙස මෙම සඟරාව මගින් කලාපයෙන් කලාපයට හඳුන්වාදීමට අපි බලාපොරොත්තු වෙමු.

එම ලිපි මාලාවේ පළමුවැන්න ලෙස දේශීය හා විදේශීය වෙළඳපොළ පාදක කරගත් අන්නාසි වගාව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ විමසා බලමු.

## අන්නාසි වගාව

කෘෂිකාර්මික වගාවන්ට උචිත දේශගුණයක් පවතින ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය රටවලද ආහාරයට ගන්නා අන්නාසි පහත රට තෙත් කලාපයෙන්, උඩරට තෙත් කලාපයෙන් හොඳින් වගා කළ හැකි රසවත් පළතුරකි. දැනට ගම්පහ, කුරුණෑගල, පුත්තලම, බදුල්ල යන දිස්ත්‍රික්ක තුළ වගා කරන අන්නාසිවලින් 90% ක්ම විදේශීය වෙළඳපොළට සපයන අතර, ගාල්ල, මාතර, හම්බන්තොට, කළුතර, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හිද අන්නාසි තේ වතුවල සහ පොල් වතුවල බිම් වගාවක් ලෙස හොඳින් වගා කිරීමට හැකියාව ඇත. අන්නාසි ප්‍රධාන වශයෙන් ප්‍රභේද දෙකක් මුරිසි සහ කිව් (KEW) වශයෙන් ඇති අතර, මෙයින් කිව් වර්ගය යුෂ ගැනීම හා ටින් කිරීම සඳහා වඩාත්ම යෝග්‍ය වේ. කහ වර්ණය හා රසය, සුවඳ මෙන්ම අපතේ යන ප්‍රමාණය මෙම කිව් වර්ගයේ අඩුවීම අන්නාසි ටින් කිරීම සඳහා වඩාත් සුදුසුවීමට හේතුවී ඇත.

## වෙළඳපොළ

මෙවැනි ව්‍යාපෘතියක් ආයෝජන අවස්ථාවක් ලෙස තෝරාගැනීමට පළමුවෙන්ම වඩාත්ම විශ්ලේෂණය කළ යුත්තේ වෙළඳපොළ ශක්‍යතාවයයි. හොඳ වෙළඳපොළක්, ලබාගැනීමට තිබෙන ඉඩකඩ හැකියාව සුදුසු ආයෝජන අවස්ථාවක් තෝරා ගැනීමට විශේෂයෙන්ම වැදගත්වේ. අන්නාසි නැවුම් මෙන්ම පලතුරු යුෂ, සිරප් තුළ බහාලන අන්නාසි ටින් සඳහාද පලතුරක් ලෙස දේශීය හා විදේශීය වෙළඳපොළ ඉල්ලුමක් පවතී. විශේෂයෙන්ම මැද පෙරදිග රටවල ටින්කළ අන්නාසි සඳහා විශේෂයෙන් හොඳ ඉල්ලුමක් පවතින අතර, ලෝකයේ බොහොමයක් රටවල වෙළඳපොළක් ඇත. දේශීයව වුවද වර්තමානයේ ඉතා ජනප්‍රිය වෙමින් පවතින සුපර්මාකට් වෙළඳ මධ්‍යස්ථානවල අලෙවි කරන ආනයනික ටින් කළ පලතුරු සඳහා ආදේශකයක් ලෙස අලෙවි කිරීමට තිබෙන අවස්ථාවන් බහුලය.

**ශ්‍රී ලංකාවේ නැවුම් අන්නාසි අපනයනය (රුපියල් මිලියන )**

| විස්තරය | 2000 | 2001 | 2002 | 2003 | 2004 |
|---|---|---|---|---|---|
| මාලදිවයින | 56.1 | 59.9 | - | 52.3 | - |
| එ. අ..ජනරජය | 10.6 | 12.6 | - | .46 | .29 |
| කුවේට් | 6.6 | 8.0 | - | 8.9 | - |
| බහරේන් | 2.3 | 3.8 | - | 1.3 | - |
| කටාර් | 3.7 | 3.3 | - | 1.04 | - |
| සවුදි අරාබිය | 3.1 | 1.5 | - | 3.1 | - |
| ඕමාන් | 0.3 | 0.1 | - | 0.1 | - |
| ජර්මනිය | 7.7 | 41.3 | 11.0 | 6.1 | 7.3 |
| එ.රාජධානිය | 1.8 | 9.5 | 14.8 | 4.2 | - |
| නෙදර්ලන්තය | 2.9 | 3.4 | - | 4.8 | 5.7 |
| මැලේසියාව | 0.06 | 0.3 | - | 11.7 | - |
| එ. අ..ජනරජය | 11.8 | 20.7 | 26.5 | 3.7 | - |
| අනෙකුත් | 0.88 | 0.78 | 1.9 | 94.93 | 2.49 |
| එකතුව | 107.84 | 165.18 | 53.2 | 94.93 | 14.88 |

## යුරෝපා වෙළඳපොළ

ශ්‍රී ලංකාවේ අන්නාසි සඳහාවන ප්‍රධාන විදේශ වෙළඳපොළ මැද පෙරදිග රටවල් සහ මාලදිවයින වුවද, යුරෝපීය සංගමයට අයත් රටවල් 15 ක තිබෙන විශාලතම වෙළඳපොළටද අපනයනය කරයි. ඇමරිකාවට වඩා යුරෝපයේ අන්නාසි සඳහා හොඳ වෙළඳපොළක් ඇත. යුරෝපීය වෙළඳපොළ සඳහා සංවර්ධනයවන රටවලින් තිබෙන තරඟකාරීත්වය ශ්‍රී ලංකාවට බලපාන අතර, දැනට යුරෝපීය රටවල වැඩිම ඉල්ලුමක් තිබෙනුයේ ක්‍යු වර්ගයේ අන්නාසි වලටය. යුරෝපීය පාරිභෝගිකයින්ගේ පැවැත්ම සහ වෙනස්වීමේ ස්වභාවය පලතුරු සඳහා පවතින ඉල්ලුම ඉහළ යාමට බලපා ඇත. විදේශීය රටවල පලතුරු පරිභෝජනයට තිබෙන වැඩි කැමැත්තද මේ සඳහා බලපා ඇත. යුරෝපීය වෙළඳපොළට අන්නාසි ඉදිරිපත් කිරීමේදී නියමිත ප්‍රමිතීන් අන්නාසිවල තත්ත්වය තිබීම අත්‍යාවශ්‍ය වේ. ගෙඩි නැවුම් අන්නාසි සමග එක සමාන ගෙඩි, ප්‍රමිතියෙන් සමානවීම වැදගත් වේ. උෂ්ණත්වයට අනුකූලව තැබීමට අවශ්‍ය වන අතර, අන්නාසි හොඳ පෙනුමකින් යුක්තවිය යුතුව ඇත. යුරෝපීය වෙළඳපොළට විශාල ප්‍රමාණයක් සැපයීමට විශාල පරිමාණයෙන් අන්නාසි වගා කිරීම ආයෝජන අවස්ථාවකි. රසයෙන් වැඩි මුරුසි අන්නාසි විශාල පරිමාණයෙන් වගාකර යුරෝපා වෙළඳපොළ ලබා ගැනීමට අවස්ථාවක් තිබෙන බැව් මේ කරුණු අනුව පැහැදිලි වනු ඇත.

ශ්‍රී ලංකා අපනයන මණ්ඩල දත්තවලට අනුව අප රටෙන් පිටරට යවනු ලැබූ විවිධ අන්නාසි වටිනාකම රුපියල්වලින් පහත දැක්වේ.

## අන්නාසි යුෂ අපනයනය

**යුරෝපීය වෙළඳපොළ ( රු. මිලියන)**

| විස්තරය | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 |
|---|---|---|---|---|---|---|
| ජර්මනිය | 3.2 | 3.2 | 10.6 | 20.6 | - | 0.74 |
| නෙදර්ලන්තය | 1.2 | 1.9 | 2.2 | - | - | - |
| මාලදිවයින | 0.05 | 0.04 | 0.13 | 0.14 | - | - |
| අනෙකුත් | 0.21 | 0.94 | 13.32 | 0.33 | - | 0.29 |
| එකතුව | 4.66 | 4.08 | 25.53 | 20.53 | - | 3.6 |

| විස්තරය | 2000 රුපියල් | 2001 රුපියල් | 2002 රුපියල් | 2003 රුපියල් | 2004 රුපියල් | 2005 රුපියල් |
|---|---|---|---|---|---|---|
| නැවුම් අන්නාසි (fresh) | 1078843172 | 165184710 | 156404656 | 131653816 | 171965127 | 142683672 |
| වියළි අන්නාසි | - | - | - | 65405500 | 65128960 | 67714583 |
| යුෂ අන්නාසි | 6078481 | 13321830 | 2477845 | 1027001 | 2678665 | 10370117 |

නැවුම් අන්නාසි අපනයනය 2000 වසරට වඩා 2001 වර්ෂයෙහි වර්ධනයක්ද, 2002 වර්ෂයට වඩා ඌණතාවයක්ද, 2003, 2004, 2005 වර්ෂවල ද මෙවැනිම විචල්‍යතාවයක්ද ඉහත දත්ත අනුව පෙන්නුම් කෙරේ. ඒ සඳහා අපනයන වෙළඳපොළ තරඟකාරීත්වය මෙන්ම නැවුම් අන්නාසි සැපයුම අඩු වැඩිවීමද බලපා ඇත. විශේෂයෙන්ම අන්නාසි වගාවේ වර්ධනය අපනයන වෙළඳපොළ ඉල්ලුමට ප්‍රමාණවත් නොවීමද එයට හේතුවී ඇත. අන්නාසි යුෂ වියළි අන්නාසි ටින්කර අපනයනය කිරීම සම්බන්ධ ඉහත දත්ත මගින්ද විචල්‍යතාවයක් මෙම වසර කිහිපය තුළ පෙන්නුම් කරයි. එම දත්ත තොරතුරු විග්‍රහකර බැලීමේදී අපනයන වෙළඳපොළ අවස්ථා තරඟකාරී ලෙස ලබා ගැනීමට තිබෙන හැකියාව පෙන්නුම් කරයි.

## අන්නාසි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘති

- අන්නාසි යුෂ/කෝඩියල් නිෂ්පාදනය
- අන්නාසි වියළීම. විජලන නිෂ්පාදන
- අන්නාසි යුෂ හා කැබලි ටින් කිරීම

## අන්නාසි ටින් කිරීමේ ක්‍රියාවලිය

- අන්නාසි ගෙඩියේ නැටි, පත්‍ර, ඉවත්කර ශුද්ධ කිරීම
- මල නොබැඳෙන වානේ පිහියක් භාවිතයට ගෙන පොතු ඉවත් කිරීම
- අඟල් 1/2 ප්‍රමාණයට හෝ අවශ්‍ය හැඩයකට කැබලි යන්ත්‍රයක් මගින් කපා ගැනීම
- ටින්වල අසුරාගත් අන්නාසි සීනි වලින් සාදා ගන්නා සිරප් පුරවා කල්තබා ගන්නා ද්‍රව්‍ය එක් කිරීම
- ටින් සීල්කර ජීවානුහරණය කිරීම
- මුද්‍රණය කළ ටින් භාවිතා නොකරන්නේ නම් ටින්වල ලේබල් ඇලවීමෙන් පසුව ගබඩා කිරීම
- වෙළඳපොළට යැවීම, සුදුසු පරිදි කිරීම

**අන්නාසි වියළීම සහ අන්නාසි ටින් කිරීමේදී රස, වර්ණය නොවෙනස්ව පවත්වාගෙන යාමට සුදුසු උසස් තත්ත්වයේ අන්නාසි අඛණ්ඩව සපයා ගැනීම, කැබලි කිරීම සමානව විධිමත්ව සිදු කිරීමට අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ.**

අන්නාසි පලතුරු ටින් කිරීමේ ව්‍යාපෘතියක් ව්‍යාපාරයක් ලෙස තෝරා ගැනීමට, ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණය, ඒ සඳහා කළ යුතු ආයෝජනය යන්ත්‍රෝපකරණ, ඒවා පිළිබඳ තොරතුරු අවශ්‍ය වේ.

## ව්‍යාපෘති සැලැස්ම

(1) කර්මාන්තශාලා ගොඩනැගිලි - රු.300000.00
(වර්ග අඩි 2000 )

(2) යන්ත්‍රෝපකරණ

| | | |
|---|---|---|
| i. අන්නාසි කැබලිවලට කපන යන්ත්‍රය | රු. | 150,000.00 |
| ii. සිරප් උණු කිරීම හා කවලම් කිරීම උපකරණය | රු. | 100,000.00 |
| iii. ටින් සීල් කිරීමේ යන්ත්‍රය | රු. | 100,000.00 |
| iv. පීඩන උඳුන හා අනෙකුත් උපකරණ | රු. | 150,000.00 |
| උප එකතුව | රු. | 500,000.00 |
| (3) කාරක ප්‍රාග්ධන වියදම් | රු. | 50,000.00 |
| එකතුව | රු. | 10,00000.00 |

(4) සේවක අවශ්‍යතාව

| | |
|---|---|
| කළමණාකාර | 01 |
| පුහුණු කම්කරු | 05 |
| නුපුහුණු කම්කරු | 05 |
| රියැදුරු | 01 |
| ආරක්ෂක | 01 |
| සහායක | 02 |
| එකතුව | 15 |

(5) වාර්ෂික නිෂ්පාදනය


අන්නාසි ග්‍රෑම් 500 ටින් - 300000


කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
615, ගාලුපාර, කටුබැද්ද, මොරටුව

**සේවා පහසුකම්**

- කාර්මික තොරතුරු උපදේශක සේවා
- නව ව්‍යාපෘති හා ආයෝජන අවස්ථා
- වාත්තු, විද්‍යුත් ආලේපන, ඉංජිනේරු සේවා
- යන්ත්‍ර තක්සේරු, පැස්සුම්කරු තත්ත්ව හා ප්‍රමිති වාර්තා
- රසායන හා ඉදිරිකිරීම් නිෂ්පාදන තාක්ෂණය
- ආහාර, ශාක තෙල්, කෙඳි සහ වෙනත් නිෂ්පාදන
- කෘෂි නිෂ්පාදන තාක්ෂණය
- රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන තාක්ෂණය
- සම්භාණ්ඩ හා පාවහන් නිෂ්පාදන තාක්ෂණය හා ඒ ආශ්‍රිත රැකියා පුහුණුව
- උපකොන්ත්‍රාත් සහ වෙළඳපොළ තොරතුරු
- භාණ්ඩ ප්‍රදර්ශනය හා අලෙවි පහසුකම්
- ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධනය
- කාර්මික ජනපද
- ව්‍යවසායක සංවර්ධන උපදේශක සේවා
- අන්තර්ජාල තොරතුරු ගවේෂණය
- ඵලදායිතාව හා තත්ත්ව වර්ධනය
- ග්‍රැෆික් නිර්මාණ හා ඕෆ්සෙට් මුද්‍රණය

**Manhole Covers - Quality Products of IDB**



Manhole Covers, Frames and Surface Boxes are produced at the IDB foundry conforming to British Standard BS 124 and with strict quality control.